## 152 – මගේ මහන්සියේ පලයි

මගේ මහන්සියේ පලයි ම’ජේසුනේ මෙදෑ
මගේ මෙ ජීවිතේ හරයි පුදමි දෝත් වැඳෑ
මගේ ලොවේ රජා ඔබයි අනේ ඉතින් මදෑ
මගේ පැතුම් තිගා නොවෙයි පුදමි පියුම් නෙදෑ

මෙ පූ මෙ මී ඔබේ කයයි ලෙයයි සිතේ හොවා
මගේ හදේ බැගෑම වන්දනාව රැව් දෙවා
පියේ ඔබේ වදන් අසා ඇදෙන් උදේ හවා
ම’ ජීවිතේ ඔබේ නමින් ම ජීවිතේ වෙවා